**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2018

**බදු නීතිය**

(පැ: 03යි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. ආයෝජන වත්කමක් බැහැර කිරීමේදී ලැබෙන ප්‍රතිෂ්ඨා මුදල, එකී ආයෝජන වත්කම උපලබ්ධි කරන අවස්ථාවේදී එහි පිරිවැය ඉක්මවන විටෙක බදු ගෙවන්නා මත බදු වගකීම පැනවීම මගින්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හරහා ශ්‍රී ලංකාවේ බදු තන්ත්‍රයට ප්‍රාග්ධන ලාභ මත බදු අයකිරීම නැවත හඳුන්වා දී ඇත.

   ආයෝජන වත්කම, ප්‍රතිෂ්ඨාව, පිරිවැය සහ උපලබ්ධි කිරීම යන යෙදුම් ආශ්‍රිතව ලබා දී ඇති නිර්වචනයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ප්‍රාග්ධන ලාභ මත බදු වගකීම පැනවීමට අදාළ වන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් සාකච්ඡා කරන්න.

2. ඩැනී පෙරේරා යනු "ඩී එන්ටර්ටේන්මන්ට්" නමැති බලපත්‍ර සහිත සූදු සහ ඔට්ටු ඇල්ලීමේ මධ්‍යස්ථානයක හිමිකරු වේ. ඔහු විසින් තක්සේරු වර්ෂය තුළ පහත සඳහන් වියදම් සිදු කර ඇති අතර ඔහුගේ ආදායම ගණනය කිරීමේදී එම වියදම් අඩු කිරීම් වශයෙන් දැක්වීමට අපේක්ෂා කරයි. ඔබ ඔහු වෙත කෙසේ උපදෙස් ලබා දෙන්නේ ද?

   අ) "ඩී එන්ටර්ටේන්මන්ට්" සඳහා ප්‍රවේශ පත්‍ර මුද්‍රණය සඳහා දරන ලද රුපියල් 500,000/- ක මුද්‍රණ ගාස්තු

   ආ) කැසිනෝ ක්‍රීඩා කිරීමේදී ඔහුට අහිමි වූ රුපියල් 250,000/-ක මුදල

   ඇ) සූදු ක්‍රීඩා බලපත්‍රය නියමිත දින අළුත් කිරීමට අතපසු වීම නිසා රජය වෙත ගෙවීමට සිදු වූ රුපියල් 50,000/- ක දඩ මුදල

   ඈ) ව්‍යාපාර පරිශ්‍රය තුළ භාවිතය සඳහා පාවහන් ඇතුළු කාර්යාලයීය ඇඳුම් මිලදී ගැනීමට වැය කළ රුපියල් 75,000/-ක මුදල

   ඉ) ව්‍යාපාරයේ භාවිතය සඳහා ඔට්ටු ඇල්ලීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට වැය කළ රුපියල් 100,000/- ක මුදල

3. තැනැත්තෙකුගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී යොදා ගන්නා ආදායම් මූලාශ්‍ර ආශ්‍රිතව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ දක්වා ඇති ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් විවේචනාත්මකව විග්‍රහ කරන්න. මෙම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් මගින් බදු ගෙවන්නා මත සහ ශ්‍රී ලංකා රජයෙහි ආදායම් ජනනය කිරීමේ හැකියාව මත ඇති කරන බලපෑම කෙරෙහි අවධානය යොමු කිරීම ඔබෙන් අපේක්ෂා කෙරේ.

4. බදුකරණයේ එක් ප්‍රධාන මූලධර්මයක් වන්නේ එය සරල සහ ක්‍රියාවට නැංවීම පහසු විය යුතු වීමයි. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ආශ්‍රයෙන්, මෙම මූලධර්මය කෙතරම් දුරට අනුගමනය කර තිබේදැයි සාකච්ඡා කරන්න.

5. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අභියාචන කාර්ය පටිපාටිය ඇසුරෙන් පහත කාරණා විවේචනාත්මකව විග්‍රහ කරන්න.
   අ) බදු ගෙවන්නා සතු පොදු නීති අයිතිවාසිකම් (Public law rights),
   ආ) 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනතේ අදාළත්වය.

6. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අදාළ ප්‍රතිපාදනයන් ඇසුරෙන් පහත කාරණා තක්සේරු කරන්න.
   අ) පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබෙන බලතල, එහි අරමුණ ඉක්මවා යන්නේද,
   ආ) පනතේ සඳහන් බදු වැලැක්වීමේ (tax avoidance) ප්‍රතිපාදනයන්හි ඵලදායීතාව.

7. පහත ඕනෑම කාරණා දෙකක බදු වගකීම විවේචනාත්මකව විග්‍රහ කරන්න.
   අ) පුණ්‍ය ආයතන;
   ආ) භාර;
   ඇ) ආයෝජන ආදායම.

**UNIVERSITY OF COLOMBO, SRI LANKA**
**FACULTY OF LAW**

**BACHELOR OF LAWS DEGREE EXAMINATION - YEAR IV- 2018**

**TAX LAW**
(Three Hours)

Total Number of Questions: 07

Answer any **FOUR** questions and **NO MORE**

(Candidates will be penalized for illegible handwriting.)

---

1. The Inland Revenue Act, No 24 of 2017, re-introduces Capital Gains Tax to the tax regime of Sri Lanka by imposing a tax liability on the tax payer when the consideration received for the disposal of an investment asset exceeds the cost of the asset at the time of its realisation.

   Discuss the provisions of the Inland Revenue Act, No 24 of 2017, which imposes tax liability on capital gains, with special reference to the definitions of the terms investment asset, consideration, cost and realisation.

2. Danny Perera is the sole proprietor of a licensed gaming and betting centre named "D Entertainment". He incurred the following expenses during the year of assessment and wishes to deduct the said expenses in calculating his income. How would you advise him?

   A. Printing charges amounting to a sum of Rs 500,000/- for printing entrance tickets for "D Entertainment".

   B. Rs 250,000/- that was lost by him while playing at the casino.

   C. A fine of Rs 50,000/- payable to the government for failing to renew the gaming license by the due date.

   D. Rs 75,000/- that was spent to buy office attire including shoes to be worn at the business premises.

E. Rs 100,000/- spent on purchasing a new gambling machine to be used for his business.

3. Critically analyse the statutory provisions laid down in the Inland Revenue Act, No 24 of 2017, with regard to the sources of income in calculating a person's assessable income. You are required to consider the impact of these statutory provisions on tax payers, as well as on capacity for revenue generation of the government of Sri Lanka.

4. One of the key principles of a taxation regime is that it should be simple and easy to implement. Discuss, with reference to the Inland Revenue Act, No 24 of 2017, to what extent this principle has been followed.

5. Critically evaluate the appeals procedure in the Inland Revenue Act, No 24 of 2017, in relation to:
   a. the public law rights of the taxpayer;
   b. the relevance of the Tax Appeal Commission Act, No 23 of 2011.

6. Assess the following, with reference to the relevant provisions of the Inland Revenue Act No 24 of 2017:
   a. whether the powers of recovery of tax in default given to the Inland Revenue Department exceed their purpose;
   b. the effectiveness of the tax avoidance provisions of the Act.

7. Critically evaluate the tax liability of any two of the following:
   a. charitable institutions;
   b. trusts;
   c. investment income.